# ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඩලීම සඳහා නෛතික ප්‍රතිසංස්කරණ

සිව්වන කොටස

## අම්ල ප්‍රහාර (ඇසිඩ් ප්‍රහාර)

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 නොවැම්බර්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෑඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව

දුරකථන: +9411 2081384, +94112081385, +94112081386

ෆැක්ස්: +9411 2081388

වෙබ්: www.cpalanka.org

ඊමේල්: info@cpalanka.org

ෆේස්බුක්: www.facebook.com/cpasl

ට්විටර්: @cpasl

# පිළිගැන්වීම

මෙම වාර්තාව කුෂ්මිලා රණසිංහගේ සහාය ඇතිව කයාති වික්‍රමනායක විසින් කරන ලද පර්යේෂණයක් පදනම්කර ගනිමින් රචනා කරන ලදි. මෙම වාර්තාවෙහි මූලික කෙටුම්පත් සම්බන්ධයෙන් අදහස් සහ යෝජනාවන් ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, භවානි ෆොන්සේකා සහ චාර්යා සමරකෝන් විසින් ලබාදෙන ලදි. වාර්තාව සංස්කරණය කරන ලද්දේ පසන් ජයසිංහ විසින් වන අතර එහි පිටු සැකසුම අයෝද්‍යා ගජනායක විසින් කරන ලදි.

# පටුන

පිළිගැන්වීම ........................................ 2

පටුන ........................................ 3

හැඳින්වීම ........................................ 4

අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර යනු මොනවාද? ........................................ 4

ඇසිඩ් ප්‍රහාර නම් වූ ක්‍රියාවෙහි බරපතලකම ........................................ 5

ඇසිඩ් ප්‍රහාර සිදු කිරීම සඳහා පෙළඹීමේ හේතු ........................................ 8

වර්තමානයෙහි පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද? ........................................ 8

ජාත්‍යන්තර නීතිමය ප්‍රතිචාර ........................................ 11

අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් අදාල වන නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ ........................................ 15

නීති ප්‍රතිසංස්කරණ ........................................ 15

ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ........................................ 16

## හැඳින්වීම

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් වන නෛතික ක්ෂේත්‍රයෙහි ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් විමසීමක් කරනු ලබයි. මෙකී වාර්තාව වූ කලී ප්‍රස්තුත විෂය කරුණ වන අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් පරිපූර්ණ විශ්ලේෂණයක් නොවන අතර එකී සංසිද්ධිය කෙරෙහි නීතිය සහ ප්‍රතිපත්තිය කවර ආකාරයකින් ඊට ප්‍රතිචාර දක්වන්නේ ද යන්න අරමුණු කරගන්නා ලද විශ්ලේෂණයකි. මෙම වාර්තාව මඟින් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් වන ගැටලු විසඳීම උදෙසා අවැසි නෛතික ප්‍රතිසංස්කරණයන් සහ එකී නෛතික ප්‍රතිසංස්කරණය වඩාත් ඵලදායී කරගැනීම උදෙසා සුදුසු ප්‍රතිපත්තිමය නිර්දේශයන් ඉරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාව ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට එරෙහිව ක්‍රියා කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ ඉදිරිපත් කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternaives - CPA) විසින් ප්‍රකාශයට පත්කරන ලද ලිපි මාලාවක සිව්වන වන වෙළුමයි. අදාල විෂය කරුණ සම්බන්ධයෙන් දැනට පවත්නා නීති තත්වයන් විමර්ශනයට ලක් කිරීම සහ මෙකී ගැටලුකාරී ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නීති ප්‍රතිසංස්කරණ මන්දගාමී මට්ටමක පැවතීමට හේතු කවරේද යන්න පළමුවන වෙළුම ඔස්සේ ඉදිරිපත් කරන ලදි. මාර්ගගත ලිංගික හිංසනය සහ කාන්තා ලිංගික විකෘති කිරීම් අපරාධ ගණයට අන්තර්ගත කිරීම සඳහා නිශ්චිත නීති හඳුන්වා දීමේ අවශ්‍යතාව පිළිවෙලින් දෙවන වෙළුම සහ තෙවන වෙළුම් ඔස්සේ විමසා බලනු ලබයි.

### *අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර යනු මොනවාද?*

අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර යන්න නිර්වචනය කරනු ලබන්නේ *'බරපතල ලෙස අක්‍රමිකතා, විකෘති කිරීම්, වධහිංසා පැමිණවීම් හෝ ඝාතනය කිරීමේ අරමුණින් පුද්ගලයෙකුට ඇසිඩ් හෝ වෙනත් ඒ හා සමාන විඛාදන ද්‍රව්‍යයක් විසි කිරීම, වත් කිරීම හෝ ගැල්වීම සම්බන්ධ පූර්ව සැලසුම් කරන ලද ප්‍රහාරයකි'*.[1] එය බොහෝ සමාජවල දක්නට ලැබෙන සංසිද්ධියක් වුවද එය වැළැක්වීමට සහ ඊට අදාල වැරදිකරුවන්ව වගවීමට ලක් කිරීම සඳහා ඓතිහාසිකව ගෙන ඇත්තේ සුළු වශයෙන් වූ පියවර පමණි. කලාපීය වශයෙන් සංඛ්‍යා වෙනස් වන අතර, ගෝලීය මට්ටමෙන්[2] කාන්තාවන්ට අසමාන ලෙස බලපාන අතර එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයකි.[3] එයින් සිදුවන හානියේ බරපතලකම සහ ඒ සඳහා භාවිතා

---

[1] කාම්බෝජයේ අම්ල ප්‍රහාරයන්ගෙන් දිවි ගලවා ගත් තැනැත්තන්ගේ පුණ්‍යායතනය, 'නිශ්ශබ්දතාව බිඳ දැමීම - කාම්බෝජයේ ඇසිඩ් ප්‍රහාර ආශ්‍රිත ගැටලු ආමන්ත්‍රණය කිරීම, 2010 මැයි https://web.archive.org/web/20131219010314/http://www.cambodianacidsurvivorscharity.org/docs/breaking_t h e_silence.pdf

[2] බිපාෂා බාරුවා සහ අයිෂා සිද්දිකා, 'අම්ල ප්‍රහාර වැඩි වෙමින් පවතින අතර විෂ සහිත පුරුෂාධිපත්‍යය ඊට හේතුවයි, සංවාදය, 2017 අගෝස්තු 14 https://theconversation.com/acid-attacks-are-on-the-rise-and-toxic-masculinity-is-thecause-82115

[3] අංක 2003/45 දරණ මානව හිමිකම් යෝජනාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම, 2003 අප්‍රේල් 23, පිටුව 2 http://ap.ohchr.org/documents/E/CHR/resolutions/E-CN_4-RES-2003-45.doc

කරන ආයුධවලට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සමග එය සිදුවීම වැළැක්වීම සඳහා දැඩි නීති සහ රෙගුලාසි පැනවීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ නිතරම අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර හා බැඳි සිදුවීම් වාර්තා වේ. වර්ෂ 2020 ජනවාරි 11 වන දින කෑගල්ල ප්‍රදේශයෙහි දී ඇති වූ ආරවුලක් හේතුවෙන් පුද්ගලයින් අට දෙනෙකුට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල වූ අතර ඔවුන්ගෙන් දෙදෙනෙකු අන්ධභාවයට පත් වූ බව වාර්තා වේ.[4] වර්ෂ 2019 ජූලි 8 වන දින කලෙලියා ප්‍රදේශයෙහිදී කාන්තාවකට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල වූ අතර වින්දිතයා විසින් ප්‍රේම සම්බන්ධකමක් පැවැත්වීම හේතුකොටගෙන එල්ල වූයේ යැයි කියනු ලබන මෙම ප්‍රහාරයෙන් ඇය දරුණු ලෙස තුවාල ලැබීය.[5] වර්ෂ 2019 ජූලි 7 වන දින ගොඩපොල ප්‍රදේශයෙහි කාන්තාවක් සහ ඇගේ දියණිය ඇසිඩ් ප්‍රහාරයකට ගොදුරු වූ අතර අදාල සිදුවීමෙන් පසුව සැකකරු සියදිවි නසාගත් අතර එකී ප්‍රහාරයට හේතුව ඔවුන් අතර පැවති සම්බන්ධතාවයක් පිළිබඳ ගැටලුවක් බව පැහැදිල විය.[6] 2019 ජුනි 6 වන දින පයාගල ප්‍රදේශයෙහි පදිංචි පුද්ගලයෙකු ඇසිඩ් ප්‍රහාරයකින් මියගොස් ඇති අතර එහිදී ඔහුගේ බිරිඳ සහ නිවසෙහි සේවයට සිටි තැනැත්තා සැකකරුවන් විය.[7] 2019 පෙබරවාරි 14 වන දින රත්කැකුලව ප්‍රදේශයෙහි දී කාන්තාවක් සහ ඇගේ දියණිය නිදා සිටියදී ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කළ අතර මව ඒ හේතුවෙන් මරණයට පත්විය. මැතකදී මවගෙන් වෙන්ව සිටි ඇගේ පියා මෙම ප්‍රහාරයට සම්බන්ධ බවට දියණිය විසින් සාක්ෂි දුන්නාය.[8] මෙම ද්වේෂසහගත සිදුවීම් බොහොමයක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ අවස්ථා වේ.

## *ඇසිඩ් ප්‍රහාර නම් වූ ක්‍රියාවෙහි බරපතලකම*

බොහෝ අවස්ථාවන්හීදී ඇසිඩ් ප්‍රහාර මඟින් මාරාන්තික තත්වයක් උද්ගත කිරීම හෝ එවන් තත්වයකට පත් කිරීමද අපේක්ෂා නොකරන නමුදු, එය බරපතල ආබාධයකට හේතු විය හැකි අතර වින්දිතයාට ජීවිත කාලය පුරාම කායික, මානසික හා සමාජීය බලපෑමක් ඇති කරයි.[9] ඇසිඩ් ප්‍රහාර සඳහා භාවිතා කරනු ලබන අම්ල වර්ග (නිදසුනක් ලෙස, සල්ෆියුරික් අම්ලය) මඟින් ශාරීරිකව, නිදන්ගත වේදනාවක් හා දැඩි විරූපී තත්වයකට හේතු විය හැකි අතරම සමහර විට සමට මෙන්ම ශරීරයෙහි අස්ථි පවා දියවීමට හේතු වේ. මෙම පිළිස්සුම් හා කැළැල් හේතුවෙන් වින්දිතයාව හඳුනාගත නොහැකි තත්වයකට පත්විය හැකි

---

[4] කෑගල්ල ඇසිඩ් ප්‍රහාරයක් හේතුවෙන් අට දෙනෙක් රෝහල් ගත කෙරේ, Newsfirst'lk, 2020 ජනවාරි 12 https://www.newsfirst.lk/2020/01/12/eight-hospitalized-over-acid-attack-in-kegalle/

[5] ඇසිඩ් ප්‍රහාරයට ගොදුරු වූ බේකරි හිමිකරුගේ අනියම් බිරිඳ, ඩේලි මිරර්, 2019 ජූලි 8 http://www.dailymirror.lk/print/front_page/Mistress-of-bakery-owner-the-victim-of-acid-attack/238-170666

[6] 'පුද්ගලයෙකු කාන්තාවක් හා දරුවන් දෙදෙනෙකුට ඇසිඩ් විසි කිරීමෙන් පසු ඔහු ද ඇසිඩ් පානය කරයි', රිපබ්ලිකන් නෙක්ස්ට්, 2019 ජූලි 8, https://www.republicnext.com/politics/man-consumes-acid-after-throwing-it-at-woman-and-two-children/

[7] විශ්‍රාමික කාන්තා ගුරුවරිය සැමියා ඝාතනය කළ බවට චෝදනා', ඩේලි මිරර්, 2019 ජුනි 6, https://www.pressreader.com/sri-lanka/daily-mirror-sri-lanka/20190606/281818580326962

[8] 'නිදා සිටියදී ඇසිඩ් ප්‍රහාරයකින් කාන්තාව මිය යයි, දියණිය තුවාල ලබා ඇත', 2019 පෙබරවාරි 15 වන දින *අද දෙරණ*, http://www.adaderana.lk/news/53263/woman-dies-daughter-injured-in-acid-attack-while-asleep

[9] සොලොටාරොෆ්, ජෙනිෆර් එල්, සහ රෝහිණී ප්‍රභා පාණ්ඩේ, 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය: දකුණු ආසියාවෙන් පාඩම්', දකුණු ආසියා සංවර්ධන සංසදය, වොෂිංටන්, ඩීසී: ලෝක බැංකුව, 2014, පි. 56, https://openknowledge.worldbank.org/bitstream/handle/10986/20153/9781464801716.pdf?sequence=1&isAllowed=y

අතර, එය ජීවිත කාලය පුරාම පවතිනු ඇත.[10] අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර බොහෝ විට වින්දිතයාගේ මුහුණ ඉලක්ක කරන අතර අන්ධභාවයට හේතු විය හැකි අතර තොල් හෝ නාස්පුඩු පිළිස්සීමට හේතු පාදක වන අතර සමහර විට එකී ශරීර අවයව ආවරණය කිරීමට හේතු වීම ඔස්සේ වින්දිතයාට සන්නිවේදන කාර්යය සිදු කිරීමද දුෂ්කර කරයි. සමහර අවස්ථා වලදී, ඇසිඩ් ප්‍රහාර මගින් වින්දිතයාගේ යාමේ ඒමේ කටයුතු සඳහා සීමාවන් ඇතිවිය හැකිය.[11] එවන් අහිතකර අම්ලයන්හි වායු ආශ්වාස කිරීමෙන් දැඩි ස්වසන අපහසුතා මෙන්ම අනෙකුත් අභ්‍යන්තර තුවාල වීම් ද සිදුවිය හැකිය.[12]

අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර හේතුවෙන් මානසික වශයෙන් ඇති වන බලපෑම ඉතා විනාශකාරී විය හැකි සේම සමහර අවස්ථාවන්හි දී මානසික රෝගී තත්වයන් මෙන්ම සියදිවි හානි කරගැනීමේ තත්වයන් පවා උද්ගත වේ. මෙවන් අම්ල ප්‍රහාර හමුවේ පශ්චාත් කම්පන සහගත මානසික ආතතිය, මානසික විෂාදිය, නින්ද නොයාම සහ ලෝකයට මුහුණ දීමට ඇති බිය ආදී තත්වයන්ට ද වින්දිතයින්ට මුහුණ දීමට සිදු විය හැකිය.[13] සමාජීය වශයෙන්, වින්දිතයින් ඔවුන් මුහුණ දුන් කම්පන තත්වය තමන්ට හුදෙකලා වීමට හේතු විය හැකි අතර අධ්‍යාපනය ලබා ගැනීමට නොහැකි වීම හෝ සුදුසු සේවා නියුක්තියක් සොයා ගැනීමට නොහැකිවීම වැනි ඍණාත්මක සමාජ හා ආර්ථික ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවිය හැකිය.[14] ඇසිඩ් ප්‍රහාර හේතුවෙන් ඔවුන්ගේ වෙනස් වූ බාහිර පෙනුම සම්බන්ධයෙන් බැඳී ඇති ආන්තිකකරණය සහ සංස්කෘතික අපකීර්තිය සමඟ ගැටගැසීමට ද ඔවුන්ට සිදු විය හැකිය.[15]

2006 දී ඇසිඩ් ප්‍රහාරයක් පිළිබඳව වූ බණ්ඩාර එදිරිව නීතිපතිවරයා යන නඩුව සම්බන්ධයෙන් තීන්දුවක් ප්‍රකාශ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවිය.[16] එම නඩුවෙහි සිද්ධිමය කරුණු සැලකීමේ දී, ඇසිඩ් ප්‍රහාරයට ලක්වූ පුද්ගලයා පැය 24 ක් ඇතුළත ඔහුට සිදු වූ තුවාල වලින් මිය ගොස් ඇති අතර, ඔහු අසල සිටි කුඩා දරුවන් දෙදෙනෙකු ද තුවාල ලබා ඇත. කෙසේ වෙතත්, මහාධිකරණය විසින් අදාල චූදිතයන් මිනීමැරුම සඳහා වරදකරුවන් කරන ලද අතර, විත්තිකරු ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද අභියාචනයේදී, ප්‍රහාරය අරමුණු කරන ලද්දේ හුදෙක් ශාරීරික තුවාලයක් පමණක් බවත්, ඒ නිසා මිනීමැරුම සඳහා කිසිදු චේතනාවක් නොමැති බවත් පෙන්වා දෙමින් පෙරකී මාහාධිකරණ තීන්දුව වෙනස් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි. කෙසේ වුවද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මිනීමැරීමේ වරද තහවුරු කල අතර, මෙම නඩුව මගින් ඇසිඩ් ප්‍රහාරය එල්ල කිරීමේ ක්‍රියාව සිදුකිරීමේ චේතනාව පිළිබඳ ප්‍රශ්න කීපයක් ඉස්මතු වේ.

වෙනත් ආකාරයේ තුවාල කිරීම් හෝ බරපතල තුවාල කිරීම් මෙන් නොව; ඇසිඩ් භාවිත කරමින් තවත් කෙනෙකුට පහර දීමේ අපරාධයක් කිරීමට තීරණය කරන විට, අදාල චෝදිත පුද්ගලයා එසේ කරනු ලබන්නේ වින්දිතයාට ජීවිත කාලය පුරාවටම මුහුණ දීමට සිදුවන දරුණු මානසික කම්පනය සහ ඉන්

---

10 'ගෘහස්ථ හිංසනය සහ අපයෝජනය පිළිබඳ විශ්වකෝෂයː 1 වන වෙළුම', සංස්කරණය කරන ලද්දේ ලෝරා එල්. ෆින්ලි, ඒබීසී-සිලෝ එල්එල්සී, 2013, පි. 4.

11 හියුමන් රයිට්ස් වොච්, 'අපාය පිළිබඳව දැනෙන්නේ කෙසේදː කාම්බෝජයේ ඇසිඩ් ප්‍රචණ්ඩත්වය', 2019 පෙබරවාරි 4, https://www.hrw.org/report/2019/02/04/what-hell-feels/acid-violence-cambodia

12 ඉහත එම, 'ගෘහස්ථ හිංසනය සහ අපයෝජනය පිළිබඳ විශ්වකෝෂය', 4 වන පිටුව

13 ඉහත එම, සොලොටාරොෆ්, ජෙනිෆර් එල්. සහ රෝහිණී ප්‍රභා පාණ්ඩේ, 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයː දකුණු ආසියාවෙන් පාඩම්'

14 ඉහත එම

15 ඉහත එම, හියුමන් රයිට්ස් වොච්, 'අපාය පිළිබඳව දැනෙන්නේ කෙසේදː කාම්බෝජයේ ඇසිඩ් ප්‍රචණ්ඩත්වය'

16 *බණ්ඩාර එදිරිව නීතිපති [2006] 2 ශ්‍රී ලංකා නීති වාර්තා 1*

උද්ගත වියහැකි අතිශය ප්‍රබල ප්‍රතිවිපාකයන්හි තත්වය දැනගෙන ය.[17] මෙබඳු අපරාධයක් සිදු කිරීමේදී අපරාධකරුවෙකුට ඇති වන ද්වේෂයේ ගැඹුර මෙයින් පෙන්නුම් කෙරේ. අදාල ක්‍රියාවෙහි සැබෑ ප්‍රතිවිපාක එය වෙනත් අපරාධවලට වඩා වෙනස් තත්වයක් බව පෙන්නුම් කරයි. බලපෑම විනාශකාරී හා ජීවිත කාලය පුරාම විය හැකි අතර ඉන් පසුව වින්දිතයාට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට ඇති අවස්ථාව බොහෝ ආකාරවලින් වලක්වනු ලබයි. ඇසිඩ් ප්‍රහාරයන්ට ගොදුරු වී වින්දිතයන් වූ තැනැත්තන් සඳහා සුවය ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේ දී විශේෂඥ ප්‍රතිකාර, නිවැරදි කිරීමේ සැත්කම් සහ උපදේශනය පිළිබඳ පුළුල් හා බොහෝ විට මිල අධික ක්‍රියාවලියක් අනුගමනය කිරීමට සිදු වේ.[18] මෙවන් වූ පරිදි ජීවිත කාලය පුරාවටම බලපෑමක් සහිත සහ අදාල හානිය නැවත යථාතත්වයට පත්විය නොහැකි අන්දමේ ස්ථිර වූ බරපතල ප්‍රතිවිපාක ක්‍රියාවක් 'ශාරීරික හානියක්' ලෙස වර්ගීකරණය කළ විට ඒවා හුදෙක් සුළු කොට තැකීමේ හැකියාව ඇති වේ.

අම්ල ප්‍රහාර හෙවත් ඇසිඩ් ප්‍රහාර සඳහා බොහෝ අවස්ථාවන්හි දී හයිඩ්‍රොක්ලෝරික්, සල්ෆියුරික් සහ නයිට්‍රික් යන අම්ල භාවිතයට යොදා ගනී.[19] අපරාධයන් සිදුකල හැකි වෙනත් ආයුධ මෙන් නොව, ඇසිඩ් ප්‍රහාර සඳහා භාවිත කරනු ලබන අම්ල සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර ඒවා බොහෝ විට වාණිජ හෝ කර්මාන්ත අරමුණු සඳහා භාවිතා කරන ද්‍රව්‍යවල සහ සමහර අවස්ථාවන්හි දී පොදු ගෘහස්ථ පිරිසිදු කිරීමේ ද්‍රව්‍යවල ද අඩංගු වේ.[20] ගිනි අවියක් වැනි ආයුධයකට ප්‍රවේශ වීම සාමාන්‍යයෙන් දුෂ්කර වන අතර එහි දී යම් යම් පරීක්ෂා කිරීම් වලට නතු වන්නට සිදුවන අතර, ඊට සාපේක්ෂව ඇසිඩ් සඳහා වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර වින්දිතයාට පෙරකී අන්දමට ගිනි අවියකින් උද්ගතවිය හැකි බලපෑමට සමාන හෝ ඊට වඩා විනාශකාරී බලපෑමක් ඇති කිරීමේ හැකියාව පවතී. කෙසේ වෙතත්, ආයුධයක් වශයෙන් භාවිත කිරීමේ දී ඇසිඩ් හෙවත් අම්ලයක පවතින විභවය හෙවත් ශක්තිය බොහෝ විට යථා පරිදි හඳුනා නොගැනේ. සමහර රටවල් අම්ල අලෙවිය සීමා කිරීමට පියවර ගෙන ඇති අතර, ශ්‍රී ලංකාව තුළ පහසුවෙන් අම්ල සඳහා ප්‍රවේශ විය හැකිය. අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් පවතින නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේදී, අදාල වරදට ද දඬුවම් කිරීම පමණක් නොව, මෙම ප්‍රහාර සඳහා භාවිතා කරන අම්ල විකිණීම පිළිබඳ රෙගුලාසි ද විසඳීමට කටයුතු කිරීමද ඉතා වැදගත් වේ.

අවසාන වශයෙන් ගත්කල, බොහෝ විට ඇසිඩ් ප්‍රහාර සිදු කරනු ලබන්නේ එකී ක්‍රියාවෙන් හානියට පත්වන වින්දිතයා දැනටමත් දන්නා පුද්ගලයින් විසිනි.[21] පළිගැනීමේ ඉඩ ප්‍රස්ථාව පිළිබඳ බිය හේතුවෙන් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් වාර්තා කිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අකමැති වීමට මෙය හේතු විය හැකිය.[22]

---

17 උදාහරණයක් ලෙස, සංජය සඳරුවන්ගේ කතාව බලන්න - 'අම්ල ප්‍රහාරයට ගොදුරු වූවන්ට නව ජීවිතයක් ලබා දීමට අවශ්‍යයි', ඩේලි මිරර්, 2020 මාර්තු 3, http://www.dailymirror.lk/print/news-features/Acid-attack-victim-wants-new-lease-oflife/131-184186

18 ඇසිඩ් සර්විවර්ස් ට්‍රස්ට් ඉන්ටර්නැෂනල්, 'ලෝක ව්‍යාප්ත ගැටලුවක්', https://www.asti.org.uk/a-worldwideproblem.html

19 කෝනල් නීති විද්‍යාලයේ සහ නිව්යෝර්ක් නගරයේ නීතිඥ සංගමයේ කාන්තා හා යුක්තිය සඳහා වූ ඇවෝන් ගෝලීය මධ්‍යස්ථානය, 'බංග්ලාදේශය, ඉන්දියාව සහ කාම්බෝජය තුළ ඇසිඩ් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම', 2011, පි. 12, ලබා ගත හැකිය https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=1861218

20 ඉහත එම, පි. 12

21 ඉහත එම, පි. 2

22 ඉහත එම, හියුමන් රයිට්ස් වොච්, 'අපාය පිළිබඳව දැනෙන්නේ කෙසේද: කාම්බෝජයේ ඇසිඩ් ප්‍රචණ්ඩත්වය'.

## *ඇසිඩ් ප්‍රහාර සිදු කිරීම සඳහා පෙළඹීමේ හේතු*

ඇසිඩ් ප්‍රහාර සඳහා පෙළඹීමේ හේතු සම්බන්ධයෙන් විමසන විට එය රටවල් සහ කලාප අතර එකිනෙකට වෙනස් තත්වයක් පෙන්නුම් කරන අතර එවැනි අම්ල ප්‍රහාරවලින් බොහෝ විට බලපෑමට පත්වන්නේ කවුරුන්ද යන්න පිළිබඳ සංඛ්‍යා ලේඛන පවතී. අම්ල ප්‍රහාර වැඩි වශයෙන්ම පවතින රටක් වශයෙන් එක්සත් රාජධානියේ (United Kingdom - UK) තත්වය සලකා බලන විට, එවන් අම්ල ප්‍රහාර සඳහා හේතුව බොහෝ විට සමූහ ප්‍රචණ්ඩත්වය සහ එහිදී වින්දිතයින් බවට පත් වන්නේ බොහෝ විට පිරිමින් ය.[23] කෙසේවෙතත්, දකුණු ආසියාවේ තත්වය ගත් විට, අම්ල ප්‍රහාර සඳහා ගොදුරු වන්නන්ගෙන් බහුතරයක් කාන්තාවන් සහ ගැහැණු ළමයින් වේ.[24]

බංග්ලාදේශය, ඉන්දියාව සහ කාම්බෝජය යන රටවල් සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයක දී, දකුණු ආසියානු රටවල් දෙකෙහි, අම්ල ප්‍රහාරයන්ට සිදුකිරීම සඳහා හේතු පාදක වූ ප්‍රධානතම කරුණු අතර ප්‍රේම/විවාහ යෝජනා ප්‍රතික්ෂේප කිරීම හෝ පිරිමින් විසින් ඉදිරිපත් කරන යෝජනා ප්‍රතික්ෂේප කිරීම, දෑවැද්ද සම්බන්ධ ආරවුල්, ඉඩම් ආශ්‍රිත ආරවුල් සහ විවාහයෙන් පරිබාහිරව පවතින අනියම් සම්බන්ධතාවයන් පිළිබඳ ඊර්ෂ්‍යාව වැනි තත්වයන් ප්‍රමුඛ වේ.[25] ස්ත්‍රියකගේ ශාරීරික පෙනුම වෙනත් ගුණාංගවලට වඩා අගය කරන පුරුෂාධිපත්‍ය සමාජවල, ඇගේ ශාරීරික පෙනුම විකෘති කිරීම පිරිමියෙකුට හෝ ප්‍රජාවකට අගෞරවයක් කිරීමේ වරදට දඬුවමක් ලෙස අර්ථ දැක්විය හැකිය. කාන්තාවක් 'ලබා ගැනීමට' නොහැකි පිරිමියෙකු අරමුණු කරනු ලබන්නේ අදාල ස්ත්‍රියට ස්ථිර හානියක් සිදු කොට ඉන් පසුව වෙනත් කිසිදු පිරිමියෙකු විසින් ඇයව පිළි නොගන්නා තත්වයට පත් කිරීමටය.

කලාපයේ වෙනත් රටවල් හා සන්සන්දනය කර බලන විට ශ්‍රී ලංකාවේ බොහෝ විට ඇසිඩ් ප්‍රහාර එතරම් ඉහළ ප්‍රමාණයකින් සිදු නොවිය හැකි නමුදු, එවැනි ප්‍රහාරවල ප්‍රතිවිපාකවල බරපතලකම හේතුවෙන්ම එකී අම්ල ප්‍රහාරයන් සම්බන්ධයෙන් වන ගැටලු විසඳීම සඳහා ව්‍යවස්ථාදායක හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

## වර්තමානයෙහි පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද?

ඇසිඩ් හෙවත් අම්ල ප්‍රහාර සිදු කිරීමේ තත්වය වටා පවතින සුවිශේෂී තත්වයන් හේතුවෙන්, එය වෙනම වරදක් වශයෙන් නීති සංග්‍රහ පොත්වලට ඇතුළත් කිරීමට අවශ්‍ය වන අපරාධයකි. කෙසේ වෙතත්, ඇසිඩ් හෙවත් අම්ල ප්‍රහාර සම්බන්ධයෙන් වන සිදුවීම්හි ප්‍රතිඵල ආමන්ත්‍රණය කිරීමේ නීති සහ අදාල වැරදිකරුවන්ට දඬුවම් කරන නීති පමණක් නොව, එවැනි ප්‍රහාර සඳහා භාවිතා කරන ද්‍රව්‍ය විකිණීම හෝ

---

[23] එන්පීආර්, 'එක්සත් රාජධානියේ ඇසිඩ් ප්‍රහාර ඉහළ යාම', 2017 අගෝස්තු 6
https://www.npr.org/sections/parallels/2017/08/06/541209398/acid-attacks-on-the-rise-in-the-u-k

[24] ග්‍රේස් යී, *'දකුණු ආසියාවේ අම්ල ප්‍රහාර'*, යේල් ග්ලෝබල් හෙල්ත් රිවීව්, 2015 ඔක්තෝබර් 15.
https://yaleglobalhealthreview.com/2015/10/15/acid-attacks-in-south-asia/

[25] ඉහත එම, කෝනල් නීති විද්‍යාලයේ සහ නිව්යෝර්ක් නගරයේ නීතිඥ සංගමයේ කාන්තා හා යුක්තිය පිළිබඳ ගෝලීය මධ්‍යස්ථානය, 'බංග්ලාදේශයේ, ඉන්දියාවේ සහ කාම්බෝජයේ ඇසිඩ් හිංසනයට එරෙහිව සටන් කිරීම',

ලබා ගැනීම නියාමනය කිරීමේ ප්‍රතිසංස්කරණ ද ඊට ඇතුළත් විය හැකිය. රටවල් කිහිපයක් (ඉන්දියාව සහ එක්සත් රාජධානිය වැනි) ඇසිඩ් ප්‍රහාරයන්ට එරෙහිව ක්‍රියා කිරීම සඳහා මෙම ක්ෂේත්‍රයන් ද්විත්වයම ආවරණය වන නෛතික ප්‍රතිසංස්කරණ ගෙන ඒමට පියවර ගෙන ඇත. මෙම දරුණු ආකාරයේ ප්‍රචණ්ඩත්වය සාර්ථකව මැඩපැවැත්වීම සඳහා නීති විරෝධී ලෙස ඇසිඩ් වෙළඳාම් කරන අයට දඬුවම් කිරීම හෝ දඬුවම් කිරීම සඳහා නීති සම්පාදනය කිරීම අතිශයින්ම වැදගත්ය.

ශ්‍රී ලංකාවට නිශ්චිතවම අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඊටම සුවිශේෂී වූ නීතිමය තත්වයක් නොමැති අතර, අදාල වරදකරුවන්ට අදාල ක්‍රියාව හේතුවෙන් උද්ගත වූ තුවාල සහ එකී සිදුවීම සම්බන්ධයෙන් පවතින සාධක පදනම් කරගනිමින් අන්තරාදායක ආයුධවලින්, ක්‍රමවලින් හෝ කැමැත්තෙන් ම තුවාල සිදු කිරීම,[26] අන්තරාදායක ආයුධවලින්, ක්‍රමවලින් හෝ කැමැත්තෙන් ම බරපතළ තුවාල සිදු කිරීම,[27] සහ මිනීමැරීම[28]/මිනීමැරීමට තැත් කිරීම[29] යන චෝදනා යටතේ නඩුවේ තත්වයන් මත නඩු පැවරිය හැකිය. ඉහත පළමුවෙන් පෙන්වා දුන් වගන්තීන් දෙකෙහි 'අන්තරාදායක ආයුධවලින් සහ ක්‍රමවලින්' යන අර්ථය තුළ විඛාදන ද්‍රව්‍ය අඩංගු වන අතර එමඟින් ඒවායේ අර්ථනිරූපණ පරාසය තුළට අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර එල්ල කිරීමද ඇතුළත් වේ.

විෂ වර්ග, අබිං හා අන්තරායකර ඖෂධ වර්ග ආඥා පනතෙහි[30] විධිවිධානයන්ට අනුව 'විෂ' සහ 'විෂ ද්‍රව්‍ය' ලෙස වර්ගීකරණය කරන ලද ඇතැම් භාණ්ඩ විකිණීම ශ්‍රී ලංකා නීතිය යටතේ සීමා කර ඇත. මෙම පනතේ 1 වන උපලේඛනයේ විවිධ වර්ගවල විෂ හා විෂ ද්‍රව්‍ය වෙන වෙනම කාණ්ඩවලට බෙදා ඇති අතර එකී විෂ හා විෂ ද්‍රව්‍ය විකිණීමේ දී විවිධාකාරයෙන් වූ සීමාකිරීම් වලට සහ රෙගුලාසිවලට යටත් වේ. විෂ ද්‍රව්‍ය වලට අදාල වන රෙගුලාසි වලට වඩා වැඩි ප්‍රමාණයක සීමාකිරීම් සහිත රෙගුලාසි විෂ සම්බන්ධයෙන් අදාල වේ. ගෝලීය වශයෙන් අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර වලදී බහුලව භාවිතා වන සල්ෆියුරික් අම්ලය සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය යන ද්විත්වය විෂ ද්‍රව්‍ය[31] ලෙස ලැයිස්තුගත කර ඇති අතර ඒවා අලෙවි කළ හැක්කේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් 'වස' ලෙස සලකුණු කර ඇති බහාලුම්වල පමණක් වන අතර එහි විකුණුම්කරුගේ ලිපිනය ද සඳහන් විය යුතුවේ. විශේෂයෙන් මෙම ද්‍රව්‍යයන් විසින් එල්ල කරනු ලබන තර්ජනයේ බරපතලකම සැලකිල්ලට ගැනීමේ දී පැහැදිලි වන්නෙ මෙලෙස පනවා ඇති සීමාවන් ඉතා අවම මට්ටමේ ඒවා බවයි.

වර්ෂ 1988 දී සම්මත වූ මත්ද්‍රව්‍ය සහ මනෝචිකිත්සක ද්‍රව්‍යවල නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ වර්ෂ 1990 දී සම්මත වූ මත්ද්‍රව්‍ය හා මනෝචිකිත්සක ද්‍රව්‍ය පිළිබඳ සාර්ක් සම්මුතිය යටතේ ඇති බැඳීම්වලට අනුකූලව, මෙකී සම්මුතීන් ද්විත්වයටම පාර්ශවකාර රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව, වර්ෂ 2008 අංක 1 දරණ මත්ද්‍රව්‍ය සහ මනෝචිකිත්සක ද්‍රව්‍යවල නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි සම්මුතිය පිළිබඳ පනත 2008[32] දී, සම්මත කරන ලදි. මෙම පනතේ පරමාර්ථය මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන්

---

26 දණ්ඩ නීති සංග්‍රහය, 315 වගන්තිය

27 දණ්ඩ නීති සංග්‍රහය, 317 වගන්තිය

28 දණ්ඩ නීති සංග්‍රහය, 294 වගන්තිය

29 දණ්ඩ නීති සංග්‍රහය, 300 වගන්තිය

30 http://www.nddcb.gov.lk/Docs/acts/25345.pdf

31 පළමු උපලේඛනය, IV කොටස.

32 https://www.lawnet.gov.lk/wp-content/uploads/2016/12/CONVENTIONS-AGAINST-ILLICITTRAFFIC-IN-NARCOTIC-DRUGS-AND-PSYCHOTROPIC-SUBSTANCES-ACT-NO-1-OF-200.pdf .

කටයුතු කිරීම වුවද, එය හයිඩ්‍රොක්ලෝරික් සහ සල්ෆියුරික් අම්ලය ඇතුළු ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා යම් යම් සීමාවන් පැනවීය.

මෙම පනත මගින් හයිඩ්‍රොක්ලෝරික් සහ සල්ෆියුරික් අම්ලය ඇතුළු ඇතැම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා බලපත්‍රය අවශ්‍ය වන පූර්වගාමී අධිකාරියක්[33] පිහිටුවනු ලැබේ.[34] එවැනි ආනයන සඳහා ආනයන හා අපනයන පනත[35] යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන අතර, එම ද්‍රව්‍ය ආනයනය, අපනයනය, භාවිතය, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබිඹු කරමින් කාර්තුමය වශයෙන් අදාල දත්ත ආනයනකරුවෙකු විසින් එකී අධිකාරියට[36] ලබා දීම ද අවශ්‍ය වේ. තවද, කිසියම් සැක කටයුතු ගනුදෙනුවක් පිළිබඳ තොරතුරු අධිකාරියට[37] වාර්තා කළ යුතු අතර, අධිකාරිය විසින් නියම කරන ලද පරිදි වාර්තා පවත්වා ගත යුතුය.[38] මෙම තත්වයන් වඩාත් භයානක අම්ල වර්ග ද්විත්වයක් ආනයනය කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් සැලකිය යුතු නියාමනයකට හේතු වන අතර, මෙම රෙගුලාසි මුළුමනින්ම වෙනස් අරමුණක් උදෙසා භාවිත වන හෙයින් එමගින් ඒවා අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර වැළැක්වීම සඳහා ප්‍රමාණවත් නියාමනයක් සිදු වීමට තරම් හේතුපාදක නොවනු ඇත.

ඇසිඩ් ප්‍රහාරයක් එල්ල වූ අවස්ථාවක දී ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳව මහජනයා අතර ඇත්තේ සීමිත දැනුවත්භාවයක් පමණි. යම් පුද්ගලයෙකුට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කල මොහොතේම නැවත යථා තත්වයට පත්කළ නොහැකි අන්දමේ හානියක් සිදුවන නමුදු, විඛාදන ද්‍රව්‍ය වහාම ජලයෙන් සෝදා ගැනීමෙන් හානිය උග්‍රවීම වළක්වා ගත හැකි වන්නේ අදාල අම්ලය ප්‍රමාණවත් ලෙස සෝදා ඉවත් වන තුරු දිගටම එය තැවරුණු ශරීර කොටස් දැවී යාමට හේතුවන හෙයිනි.[39] යම් ලෙසකින් ඇසිඩ් ශරීරයට ස්පර්ශ වූ විට ගත යුතු ක්ෂණික පියවර පිළිබඳව ජනතාවගේ දැනුවත් බව සහතික කිරීම ඇසිඩ් ප්‍රහාර මගින් වින්දිතයින්ට සිදුවන හානිය අවම කිරීමට උපකාරී වේ.

ඇසිඩ් ප්‍රහාරයකදී, විශේෂයෙන් වින්දිතයාට අදාල ප්‍රහාරයෙහි ප්‍රතිඵලයක් වශයෙන් උද්ගත වූ තුවාල වල හානියෙන් පසු සමාජයට නිසි ලෙස නැවත අන්තර්ග්‍රහණය වීමට නොහැකි වූ අවස්ථා වලදී එකී ඇසිඩ් ප්‍රහාරය පිළිබඳ වන භෞතික ක්‍රියාවෙන් ඔබ්බට ගොස් අතිශය අවධානයෙන් සලකා බැලිය යුතු සාධකයක් වන්නේ වින්දිතයාට වන්දි ගෙවීමයි. එවන් ප්‍රහාරයකින් පසුව ප්‍රතිකාර ලබා ගැනීමේ හා සැත්කම් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වන මූල්‍ය පිරිවැය දරා ගැනීමට සිදු විය හැකි අතර ස්වකීය ඉදිරි ජීවිතයෙහි කටයුතු සඳහා වින්දිතයින්ට අන් අය මත යැපීමට සිදුවනු ඇත. එබැවින්, ඔවුන්ගේ සෞඛ්‍ය, සමාජීය හා ආර්ථික අවශ්‍යතාවන් ආදී සියලු සාධකයන් ආවරණය වන අන්දමේ පරිපූර්ණ ආකාරයකින් ප්‍රතිචාර දක්වන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

---

[33] 18 වන වගන්තිය

[34] 19 (අ) වගන්තිය

[35] 20 (1) වගන්තිය

[36] 19 (ඉ) වගන්තිය

[37] 19 (ඊ) වගන්තිය

[38] 19 (උ) වගන්තිය

[39] මානව හිමිකම් නීති ජාලය 'දැවෙන අයුක්තිය: ඉන්දියාවේ අම්ල හිංසනය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයින්, ක්‍රියාකාරීන් සහ දිවි ගලවා ගත් අය සම්බන්ධයෙන් වන අයිතිවාසිකම් පිළිබඳ අත්පොත', සංස්කරණය කරන ලද්දේ කේරී මැක්බ්‍රෑම් සහ සාලිනා විල්සන් විසිනි, *සමාජ නීති තොරතුරු මධ්‍යස්ථානය: දිල්ලි,* 2014, පි. 16. https://www.slideshare.net/nbhartiya/burning-injustice-a-book-on-acid-attack-by-hrln

## ජාත්‍යන්තර නීතිමය ප්‍රතිචාර

කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා වන එක්සත් ජාතීන්ගේ අංශය විසින් කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා වන නීති සම්පාදනය පිළිබඳ අත්පොතට වර්ෂ 2011 දී අන්තර්ගත කරන ලද අතිරේකය මඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම අරමුණු කරගත් නීති සම්පාදනය සඳහා මග පෙන්වීමක් සපයනු ලබයි.[40] මෙකී අත්පොතෙහි පෙන්වා දී ඇති වැරදි අතර 'ඇසිඩ් ප්‍රහාර' ද ඇති අතර එය *'ඇසිඩ් භාවිතයෙන් සිදුවන පහරදීමකින් සිදුවන ඕනෑම ප්‍රචණ්ඩ ක්‍රියාවක්'* වශයෙන් අර්ථ දක්වා ඇත. මෙකී අතිරේකය මඟින් නිර්දේශ කරනු ලබන්නේ අපරාධය සඳහා පුළුල් අර්ථ දැක්වීමක් ලබා දිය යුතු අතර (එනම් අම්ලය භාවිතය), එය සිදුකරන ලද අභිප්‍රේරණයට වඩා අපරාධයේ ක්‍රමවේදය කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු බවයි.[41] මෙයට හේතුව වන්නේ ඇසිඩ් ප්‍රහාර එල්ල කිරීමට පෙළඹෙන බොහෝ චේතනාවන් පැවතිය හැකි අතර ඒවා සියල්ලම මෙකී අර්ථ දැක්වීමේ කොටසට අන්තර්ගත විය යුතු බවය. ප්‍රශ්නගත අම්ල ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයින්ට දඬුවම් කිරීමට අමතරව, නීති විරෝධී ලෙස ඇසිඩ් වෙළඳාම් කළ අයට දඬුවම් කිරීමට පියවර ගැනීම සම්බන්ධයෙන් ද මෙමඟින් යෝජනා කෙරේ.[42]

එලෙසම, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) යටතේ ඇති කමිටුව 2017 දී අවධාරණය කරන ලද්දේ 'කාන්තාවන්ට හානි කිරීමට භාවිතා කරන අම්ල සහ වෙනත් ද්‍රව්‍යවලට ප්‍රවේශ්‍යතාව පාලනය කිරීම වැනි ආරක්ෂිත පියවරයන් හඳුන්වා දීමට බැඳී සිටින බවයි'.[43]

වර්ෂ 2013 ඉන්දියානු අපරාධ නීති (සංශෝධන) පනත, එනම්, ස්ත්‍රී දූෂණ විරෝධී පනත වශයෙන් ද හැඳින්වෙන නීතිය මඟින් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වැරදි කිහිපයකට අදාළ ප්‍රතිසංස්කරණයක් ගෙන එන ලද අතර, 'ඇසිඩ් භාවිතයෙන් කැමැත්තෙන්ම බරපතල හානියක් සිදු කිරීම' නම් වූ නිශ්චිත වරද ද ඊට අන්තර්ගත කරන ලදි:[44]

> *පුද්ගලයෙකුගේ ශරීරයේ යම් කොටසක් හෝ කොටස් වලට ස්ථිර හෝ අර්ධ හානියක් හෝ විකෘතිතාවයක් හෝ පිළිස්සීමක් හෝ ආබාධයක් හෝ අංගවිකළතාවයක් ඇති කරන්නේ නම් හෝ එම පුද්ගලයාට අම්ලය විසි කිරීමෙන් හෝ එම පුද්ගලයාට ඇසිඩ් එල්ල කිරීමෙන් හෝ වෙනත් ඕනෑම දෙයක් භාවිතා කිරීමෙන් බරපතළ තුවාල කිරීමක් සිදු කරයි නම් හෝ එවැනි තුවාලයක් හෝ හානියක් සිදු කිරීමේ දැනුමක් සහිතව සිදු කරනු ලබන ක්‍රියාවක් සඳහා කවර තැනැත්තෙකුට*

---

[40] එක්සත් ජාතීන්ගේ සංවිධානය, 'කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ නීති සම්පාදනය කිරීමේ අත්පොතට අතිරේකයක්; කාන්තාවන්ට එරෙහි ''හානිකර පිළිවෙත්''', 2011, https://www.un.org/womenwatch/daw/vaw/handbook/Supplement-toHandbook-English.pdf

[41] ඉහත එම.

[42] ඉහත එම, පි 23.

[43] කාන්තාවන්ට වෙනස් කොට සැලකීම තුරන් කිරීමේ කමිටුව, පොදු නිර්දේශ අංක 35, 2017 ජූලි 26, (CEDAW/C/GC/35) https://tbinternet.ohchr.org/_layouts/15/treatybodyexternal/Download.aspx?symbolno=CEDAW/C/GC/35&Lang=e n

[44] 326 අ වගන්තිය.

*වුවද දඩ මුදලක් ද සහිතව වසර දහයකට නොඅඩු නමුදු ජීවිතාන්තය තෙක් වූ සිර දඬුවමක් දක්වා දීර්ඝ කළ හැකි කාල සීමාවක් සඳහා සිරගත කිරීමෙන් දඬුවම් කිරීම කළයුතුය:*

*එවැනි දඩ මුදලක් මඟින් වින්දිතයාට අදාල වරදෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ තුවාල සඳහා ප්‍රතිකාර කිරීමේ වෛද්‍ය වියදම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් යුක්ති සහගත හා සාධාරණ විය යුතුය.*

*මෙම වගන්තිය යටතේ පනවා ඇති ඕනෑම දඩයක් වින්දිතයාට ගෙවිය යුතු වේ.*

මෙම ප්‍රතිපාදනය යටතේ, ඇසිඩ් භාවිතයෙන් යමෙකුට බරපතල තුවාල සිදු කිරීමක් සඳහා දැඩි දඬුවම් නියම වේ: එනම්, ජීවිතාන්තය තෙක් සිර දඬුවමක් දක්වා දීර්ඝ කළ හැකි අන්දමට වන අවම වශයෙන් වසර දහයක සිර දඬුවමකින් දඬුවම් කළහැකිය. මීට අමතරව, වින්දිතයාට දැරිය යුතු වෛද්‍ය වියදම්වල පිරිවැය ද අදාල දඩයේ ප්‍රමාණයට බලපානු ලැබේ.

මෙම සංශෝධනය මගින් ඇසිඩ් භාවිතය නිසා බරපතල තුවාල සිදු කිරීමේ වරදට අමතරව, 'කැමැත්තෙන්ම ඇසිඩ් විසි කිරීම හෝ ඇසිඩ් විසි කිරීමට තැත් කිරීම' යන වරද සම්බන්ධයෙන්ද සංශෝධන ගෙන එන ලදි. මෙවන් අවස්ථාවක දී, සත්‍ය වශයෙන්ම ශාරීරික තුවාල සිදු කිරීමක් නොවුනත්, තුවාල සිදු කිරීමේ චේතනාවෙන් ඇසිඩ් විසි කිරීම හෝ ඇසිඩ් එල්ල කිරීමට තැත් කිරීම යන ක්‍රියාවද දඬුවම් ලැබිය හැකි අන්දමේ වරදකි. මෙම වරද සඳහා ද අවම වශයෙන් වසර පහක සිර දඬුවමක් නියම කරන අතර එය වසර දහයක් දක්වා දීර්ඝ කළ හැකි සේම ඇසිඩ් ප්‍රහාරයන්ට එරෙහිව පියවර ගැනීමේ ප්‍රබල ව්‍යවස්ථාදායක අභිප්‍රාය මෙමගින් ඉතා පැහැදිලි වශයෙන්ම පිළිබිඹු වේ.

තවද, ඉන්දියාවේ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනතට[45] වර්ෂ 2016 දී ඇති කරන ලද සංශෝධනය මඟින් ශාරීරික ආබාධිතභාවය පිළිබඳ අර්ථයේ විෂය පථය පුළුල් කරමින් ඇසිඩ් ප්‍රහාරයට ගොදුරු වූවන් ද ඊට අන්තර්ගත කිරීම සඳහා විධිවිධාන සලසන ලද අතර එහිදී එවැනි වින්දිතයන් උදෙසා අධ්‍යාපන සහ රැකියා ක්ෂේත්‍රයන්හි යම් සුරක්ෂිතතාවයක් ද ඇති වීම අපේක්ෂා කරන ලදි.[46] කෙසේ වෙතත්, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ සාර්ථකත්වය රඳා පවතින්නේ නීති සංග්‍රහයන්හි ඇති නීතිවලට අනුකූලව පමණක් නොවන අතර, ඉහතින් පෙන්වා දුන් නෛතික තත්වයන් එසේ පැවතියද ඉන්දියාව යනු වර්තමානයෙහි දී පවා ලෝකයේ ඇසිඩ් ප්‍රහාර වැඩිම ප්‍රමාණයක් වාර්තා වන රටකි.[47]

අම්ල හෙවත් ඇසිඩ් අලෙවිය නියාමනය කරන අධිකරණ බල පරාසයන් කිහිපයක් තිබේ. ඉන්දියාවේ, *ලක්ෂ්මි එදිරිව ඉන්දියානු යූනියන්*[48] නඩුවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයකට අනුව ඉන්දියාවේ මෙම

---

[45] http://legislative.gov.in/sites/default/files/A2016-49 1.pdf .

[46] සුජෝයි ධාර්, 'ඉන්දියාවේ කාන්තාවන්ට එරෙහිව අම්ල ප්‍රහාර වැඩි වෙමින් පවතී; දිවි ගලවා ගත් අය ආපසු සටන් කරති', USA Today, 2017 ජූලි 27, ලබා ගත හැකිය https://www.usatoday.com/story/news/world/2017/07/27/acid-attacks-women-india-survivors-fightback/486007001/

[47] ඉන්දියාවේ පූවර්වි ගුප්තා, අම්ල ප්‍රහාරයෙන් දිවි ගලවා ගත් අය අසමත් වේ, දත්ත මෙහි ඇත, ෂෙටෙපීපල්, 2020 ජනවාරි 16, https://www.shethepeople.tv/top-stories/issues/india-acid-attacks-survivors-data

[48] https://indiankanoon.org/doc/90443079/

රෙගුලාසි රට පුරා ක්‍රියාත්මක විය. මෙකී නඩුකරය ගොනු කරන ලද්දේ ජීවිත කාලය පුරාවටම නොමැකෙන කැළැල් ඇති කළ අන්දමේ කරුණු ඇසිඩ් ප්‍රහාරයකින් දිවි ගලවා ගත් තරුණියක් විසින් ය. මෙම රිට් අයදුම්පත යොමු කළ මහජන නඩුකරය හරහා අම්ල හෙවත් ඇසිඩ් භාවිතය හේතුවෙන් උද්ගතවන හිංසනය මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය නීති හා රෙගුලාසි සකස් කරන ලෙස රජයට උපදෙස් දෙන මෙන් ලක්ෂ්මී නැමැති කාන්තාව අධිකරණයෙන් ඉල්ලා සිටියේය. අධිකරණය විසින් නිකුත් කරන ලද නියෝග අතර, අම්ල සන්තකයේ තබා ගැනීම සහ විකිණීම පාලනය කිරීම සඳහා රෙගුලාසි බලාත්මක කරන ලෙස ඉන්දියාවේ සියලුම ප්‍රාන්ත සහ යූනියන් ප්‍රදේශවලට බලපැවැත්වෙන අන්දමේ නියෝගයක් විය. ඔවුන්ගේ නියාමන රෙගුලාසි ක්‍රියාත්මක වන තෙක් ප්‍රාන්ත සහ යූනියන් ප්‍රදේශ අතරමැදි කාලයේදී අනුගමනය කළ යුතු බවට යම් යම් මාර්ගෝපදේශ පවා අධිකරණය විසින් ලබා දී ඇත.

*"(i) අම්ල විකිණීම ආදිය පිළිබඳ, එනම් අම්ල විකුණන ලද පුද්ගලයාගේ/පුද්ගලයන්ගේ තොරතුරු, එකී අම්ල කවුරුන් වෙත කොපමණ අම්ල ප්‍රමාණයක් විකුණන ලද්දේ ද යන්න පිළිබඳ වාර්තාවන් ඇතුළත් ලොග් සටහන්/ලේඛනයක් විකුණන්නා විසින් පවත්වාගෙන යනු නොලැබේ නම්, කවුන්ටරය හරහා අම්ල විකිණීම සම්පූර්ණයෙන් තහනම් වේ. එකී ලොග් ලේඛනයේ එම අම්ල මිල දී ගත් පුද්ගලයාගේ ලිපිනය අඩංගු වියයුතු වේ.*

*(ii) සියලුම විකුණුම්කරුවන් විසින් ඇසිඩ් විකුණනු ලැබිය යුත්තේ ගැනුම්කරු විසින් පහත සඳහන් තොරතුරු සනාථ කළ පසුව පමණි:*

*(අ) රජය විසින් නිකුත් කරන ලද එම පුද්ගලයාගේ ලිපිනය ද සහිත ඡායාරූප හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම:*

*(ආ) අම්ල ලබා ගැනීමට හේතුව/අරමුණ නිශ්චිත වශයෙන් පැහැදිලි කිරීම.*

*(iii) තමන් සතු සියලුම අම්ල තොග විකුණුම්කරු විසින් අදාළ උප කොට්ඨාශ මහේස්ත්‍රාත්වරයා (Sub-Divisional Magistrate - SDM) වෙත දින 15 ක් ඇතුළත ප්‍රකාශයට පත් කළ යුතුය.*

*(iv) වයස අවුරුදු 18 ට අඩු කිසිදු පුද්ගලයෙකුට කිසිදු අම්ලයක් අලෙවි නොකළ යුතුය.*

*(v) ප්‍රකාශයට පත් නොකළ ඇසිඩ් තොගයක් නම්, එම තොගය රාජසන්තක කිරීමට අදාළ උප කොට්ඨාශ මහේස්ත්‍රාත්වරයා (Sub-Divisional Magistrate - SDM) වෙත විවෘත වන අතර එම විකුණුම්කරුට රු. 50,000/- දක්වා වූ දඩයක් ද පැනවිය හැකිය.*

*(vi) ඉහත සඳහන් ඕනෑම නියෝගයක් උල්ලංඝනය කරන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව රු. 50,000/- ක දඩයක් නියම කිරීමේ බලය අදාළ උප කොට්ඨාශ මහේස්ත්‍රාත්වරයා (Sub-Divisional Magistrate SDM) වෙත තිබේ."*

මීට අමතරව, ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය එම නියෝගය ඉදිරිපත් කිරීමේ දී ඇසිඩ් වර්ග තබා ගැනීමට හා ගබඩා කිරීමට අවශ්‍යතාවයක් ඇති අධ්‍යාපන ආයතන, පර්යේෂණාගාර, රෝහල්, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු සඳහා ඊට අවශ්‍ය මාර්ගෝපදේශ මාළාවක් ද සපයන ලදි.

කෙසේ වෙතත්, මෙවන් වූ විවිධාකාර උත්සාහයන් පැවතියද, ඉන්දියාව තුළ අම්ල සන්තකයේ තබා ගැනීම සහ විකිණීම නියාමනය කිරීම අතිශයින්ම අකාර්යක්ෂම තත්වයක පවතින බව පෙන්නුම් කිරීමට මූලිකම වශයෙන් බලපා ඇත්තේ අදාල බලධාරීන් විසින් මෙකී මාර්ගෝපදේශ නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීමයි. ඉන්දියාව තුළ අම්ල හෙවත් ඇසිඩ් සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව පවතී.[49] ශ්‍රී ලංකාව තුළ අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සාපේක්ෂව එතරම් බහුලව දක්නට නොලැබෙන පසුබිමක, අම්ල අලෙවිය පිළිබඳ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට අකමැත්තක් පැවතීම පහසුවෙන්ම දැකිය හැකිය.

එක්සත් රාජධානිය තුළ අම්ල හෙවත් ඇසිඩ් විකිණීම සම්බන්ධයෙන් සීමාවන් පනවා ඇති අතර, ඒවායින් සමහරක් මෑතකදී ක්‍රියාත්මක වූයේ වර්ධනය වෙමින් පවතින අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර වල ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින් විෂ පනත සංශෝධනය කිරීමෙනි.[50] නීතිය මඟින් ඇතැම් ද්‍රව්‍ය නියාමනය කරන ලද ද්‍රව්‍ය ලෙස ද අනෙක් ඒවා වාර්තා කළ හැකි ද්‍රව්‍ය ලෙස ද ලැයිස්තුගත කර ඇත.[51] නියාමනය කරන ලද ද්‍රව්‍ය විකිණීම දැඩි ලෙස සීමා කර ඇත; ස්වදේශ කටයුතු කාර්යාලයෙන් බලපත්‍රයක් නොමැතිව පුද්ගලයෙකුට එකී වර්ගීකරණය යටතේ වන ද්‍රව්‍යයක් මිලදී ගත නොහැක.[52] වාර්තා කළ හැකි ද්‍රව්‍ය විකිණීම දැඩි ලෙස නියාමනය නොකෙරේ; ඒවා මිලදී ගත හැකිය. නමුත් ගනුදෙනුව සැක සහිත නම්, හෝ මෙම ද්‍රව්‍ය සොරකම් කර ඇත්නම්, එය වාර්තා කිරීමට වෙළෙන්දන් විසින් කටයුතු කිරීම අවශ්‍යතාවයක් බව නීතිය මඟින් පෙන්වා දේ.[53]

එක්සත් රාජධානියේ, වර්ෂ 2019 අන්තරායකර ගිනිඅවි පනත මගින් අම්ල විකිණීම හා සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් දැඩි පාලනයක් පැනවීය. සමහර වර්ගවල අම්ල විඛාදන ද්‍රව්‍ය[54] ලෙස ලැයිස්තුගත කර ඇති අතර, එම ද්‍රව්‍ය වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකුට විකිණීමට නොහැකි අතර කිසිදු තැනැත්තෙකුට එය පොදු ස්ථානයක තබා ගත නොහැක. ඉන්දියාවෙහි දක්නට ලැබෙන ආකාරයටම, අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් වන තත්වය මැඩපැවැත්වීම උදෙසා පවතින ව්‍යවස්ථාදායක අභිප්‍රාය එක්සත් රාජධානිය තුළින් ද විද්‍යමාන වේ.

---

49 වෛශේෂ්වරී දේස්වාල්, 'අම්ල ප්‍රහාර - අම්ල අලෙවිය නියාමනය කිරීමට අවශ්‍යයි', ටයිම්ස් ඔෆ් ඉන්ඩියා, 2020 ජනවාරි 6, https://timesofindia.indiatimes.com/blogs/legally-speaking/acid-attacks-need-to-regulate-acid-sales/

50 https://www.legislation.gov.uk/ukpga/1972/66

51 එක්සත් රාජධානියේ ස්වදේශ කාර්යාලය, 'හෝම් ඔෆිස් මාර්ගෝපදේශයඃ පුපුරණ ද්‍රව්‍ය පූර්වගාමීන් සහ වස සැපයීම, ලබා ගත හැකිය https://www.gov.uk/government/publications/supplying-explosives-precursors/supplying-explosives-precursorsand-poison

52 ඉහත එම.

53 ඉහත එම.

54 1 වන උපලේඛනයඃ https://www.legislation.gov.uk/ukpga/2019/17/contents/enacted/data.htm

# අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් අදාල වන නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ

ඉහත සාකච්ඡාවට බඳුන් කල සියලු කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාව තුළ අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සම්බන්ධයෙන් පවතින ගැටලු සහ අභියෝගයන් වඩාත් සාධනීය ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා පහත සඳහන් නීති සහ ප්‍රතිපත්තිමය නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ. අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ පවතින අඩු ලුහුඬුකම් සම්බන්ධයෙන් අදාල වන ප්‍රතිසංස්කරණයන් සඳහා අවැසි නිර්දේශයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කරන ලේඛනය වන මෙම ලිපි මාලාවේ[55] 1 වන කොටස සමඟ මෙය කියවිය යුතුය.

## *නීති ප්‍රතිසංස්කරණ*

**දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනයක් වශයෙන් අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර නව වරදක් සංස්ථාපනය කල යුතු අතර එමඟින්:**

- අදාල වරද සිදු කිරීමට පෙළඹෙන හේතුව කවරක් වුවද ඒ කෙරෙහි නොව එකී වරද සිදු කරන ආකාරය පිළිබඳව, එනම්, අම්ල හෙවත් ඇසිඩ් භාවිතය, කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- 'අම්ල භාවිතා කිරීමෙන් මරණයට පත්කිරීමේ, වධහිංසා පැමිණවීමේ, විකෘති තත්වයට පත් කිරීමේ හෝ තුවාල සිදු කිරීමේ චේතනාව සහිතව හෝ එවැනි තත්වයක් උද්ගත වියහැකි බව දැන සිටීම' අදාල වැරදිකරු විසින් ඇසිඩ් භාවිත කරමින් වින්දිතයාට කුමක් කිරීමට අදහස් කර ඇත්දැයි නිශ්චිතව පෙන්වා දිය යුතුය.

- වින්දිතයාට ඇසිඩ් විසි කිරීම තුලින් ම ඇසිඩ් ප්‍රහාර සැමවිටම සිදු නොවිය හැකි බැවින්, වරදිකරු විසින් වෙනත් කෙනෙකුට හානි කිරීමට අම්ලය භාවිතා කළ හැකි සියලු ආකාරයන් අන්තර්ගත කිරීමට හැකි තරම් ප්‍රමාණවත් අන්දමේ පුළුල් පසුබිමක් පැවතිය යුතු වේ. මෙම ක්‍රියාවට ඇසිඩ් *'විසි කිරීම, වත් කිරීම හෝ වෙනත් ආකාරයකින් යොමු කිරීම...'* ඇතුළත් විය හැකිය.

- වින්දිතයාට සිදුවූ තුවාලවල බරපතලකම සම්බන්ධයෙන් නොසලකා අපරාධකරුගේ ක්‍රියාවන්ට දඬුවම් ලබා දිය හැකි අන්දමට විධිවිධාන පැවතිය යුතු වේ. චෝදනා ලැබූ පුද්ගලයෙකු වැරදිකරු බවට පත්වීම සඳහා වින්දිතයා ස්ථිර වශයෙන්ම විරූපී වීම හෝ අබාධිත තත්වයට පත් වීම අත්‍යාවශ්‍ය නොවිය යුතුය.

- උපරිම දඬුවමක් ද ඇතුළත් කළ හැකි මෙන්ම වඩාත් ඉහළ බරපතලතාවයකින් හෙබි දඬුවම් ලබා දිය හැකි අන්දමේ පසුබිමක් ද ඇතුළත් තත්වයක් පිළිබිඹු කළ හැකිය. ඒ සඳහා වින්දිතයාට සිදු වූ තුවාලවල බරපතලකම හෝ අපරාධකරු විසින් භාවිත කරන ලද අම්ල ප්‍රමාණය හෝ වර්ගය ආදී සාධකයන් මෙයට ඇතුළත් විය හැකිය.

---

[55] ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට එරෙහිව ක්‍රියා කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණයන් - 1 වන කොටස - පවත්නා නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්

- වින්දිතයාට කිසිදු හානියක් සිදු නොවන අවස්ථාවන්හිදී පවා අම්ල හෙවත් ඇසිඩ් විසි කිරීම, වත් කිරීම හෝ එවැනි කරුණක් සඳහා භාවිත කිරීම ආදී ක්‍රියාවන් මගින් වුවද වරදක් සංස්ථාපනය කරනු ලබයි.

- වින්දිතයාට වන්දි ලබා දෙන අතර, එය ඇසිඩ් ප්‍රහාරය හේතුවෙන් සිදුවන හානියේ බරපතලකමට සමානුපාතික විය යුතුය.

- අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සඳහා ආධාර කිරීම සහ අනුබල දීම වරදක් වශයෙන් (එක්සත් රාජධානියේ නීතියට සමාන තත්වයක් මෙන්) හඳුන්වා දියයුතු වේ.

- ක්ෂණිකව හානියක් වීමේ අවදානමක් ඇති විබාදන ද්‍රව්‍ය භාවිත කරනු ලබන බවට තර්ජනය කිරීම ද වරදක් බවට සංස්ථාපනය විය යුතුය.

**අම්ල හෙවත් ඇසිඩ් සහ අනෙකුත් විබාදන ද්‍රව්‍ය විකිණීම හා භාවිතය නියාමනය කිරීම අන්තර්ගත කිරීම සඳහා විෂ වර්ග, අබිං හා අන්තරායකර ඖෂධ වර්ග ආඥා පනත සංශෝධනය කිරීම:**

- අම්ල විකිණීම සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම සහ මිලදී ගැනීම් පිළිබඳ ලේඛනයක් වෙළෙන්දන් විසින් පවත්වාගෙන යෑම අවශ්‍ය වේ.

- සිල්ලර වෙළඳපොලෙහි ඇති සහ ගෘහස්ථ අරමුණු සඳහා භාවිත කරන අම්ලවල විභවය හෙවත් ශක්තිය අඩු කිරීම.

- ව්‍යාපාර ආයතනයන් විසින් ස්වකීය විබාදන ද්‍රව්‍ය තොග නියමිත බලධාරියෙකුට වරින් වර ප්‍රකාශයට පත් කිරීම සහ එවැනි විබාදන ද්‍රව්‍ය සොරකම් කිරීම් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- විබාදන ද්‍රව්‍ය නේවාසික ප්‍රදේශවලට අනවසරයෙන් ප්‍රවාහනය කිරීම (එක්සත් රාජධානියේ නීතියට සමාන පරිදි) වරදක් වශයෙන් හඳුන්වා දීම.

- හානි සිදු කිරීමේ අරමුණ සහිතව පොදු ස්ථානයක විබාදන ද්‍රව්‍යයක් සන්තකයේ තබා ගැනීම (එක්සත් රාජධානියේ නීතියට සමාන පරිදි) වරදක් වශයෙන් හඳුන්වා දීම.

- ඉහත සඳහන් විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දඬුවම් සහ දඩ මුදල් හඳුන්වා දීම.

***ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ***

- අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාරයන්ට ගොදුරු වූ වින්දිතයන් සම්බන්ධයෙන් ඇති අපකීර්තිමත් තත්වයට පිළියම් යෙදීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ඇසිඩ් පිලිස්සුම් තත්වයන් මගින් ඇතිවන කැළැල් සඳහා දිගුකාලීන වශයෙන් පිළියම් යෙදීම පිණිස අවැසි ක්‍රියා මාර්ගයන් පිළිබඳව පාසල් විෂයමාලාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ගත යුතු පියවර ඇතුළත් කිරීම. මෙය සාමාන්‍ය සෞඛ්‍ය හා ආරක්ෂාව නම් වූ ක්ෂේත්‍රයට අදාල අධ්‍යාපනයේ කොටසක් ලෙස හඳුන්වා දිය හැකිය අතර එය විශේෂයෙන්ම ඇසිඩ් ප්‍රහාරයන්ට ප්‍රතිචාරයක් ලෙස

අර්ථගැන්විය යුතු නොවන්නේ එමගින් මෙවැනි ප්‍රහාර සාමාන්‍යකරණයට පත්වීම සඳහා යම් බලපෑමක් ඇති කළ හැකි නිසාවෙනි.

- පොලීසිය, සෞඛ්‍ය සේවය සහ පළාත් පාලන ආයතන විසින් මහජනතාවට ලබා දෙන සාමාන්‍ය උපදෙස් හා මඟ පෙන්වීම්වල කොටසක් ලෙස ඇසිඩ් පිලිස්සුම් තත්වයක දී ඊට ප්‍රතිකර්ම වශයෙන් ගත යුතු පියවර ඇතුළත් කළ යුතුය.

- අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාරයන්ගෙන් සිදු වූ හානිය අවම කර ගැනීම සඳහා සෞඛ්‍ය සේවකයන්ට, පළමු ප්‍රතිචාර දක්වන පුද්ගලයන්ට සහ පොලිස් නිලධාරීන්ට මූලික ප්‍රථමාධාර පිළිබඳව ප්‍රමාණවත් පුහුණුවක් ලබා දීම.

- අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාරයන්ගෙන් සිදු වූ තුවාල වලින් දිවි ගලවා ගත් පුද්ගලයන් සඳහා වන්දි ක්‍රමයක් හඳුන්වා දීම සහ එමගින් තුවාලවල බරපතලකම, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් සහ නෛතික ක්‍රියාමාර්ගයන් සඳහා අදාල වන වියදම්, ආදායම් ඉපැයීම් අහිමි වීම සහ වෙනත් අදාළ සාධක පිළිබඳව නිසි සැලකිල්ලෙන් හානිය ගණනය කර වන්දි ලබා දීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

- අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාරයන්ගෙන් දිවි ගලවා ගත් පුද්ගලයන්ට ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා සුදුසු රැකියා අවස්ථාවන් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.